අභ්‍යන්තර විභාග නිවේදනයයි

මගේ අංකය: **PPSC/EX/1/1/5/2/2024**
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
**2024.02.01**

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
වයඹ පළාත.

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2024 මාර්තු මාසය තුළ කුරුණෑගලදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි 1 වන ශ්‍රේණියේ නිලධාරීන්ට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම් කළ හැක.

**02.** මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍ර නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කරගත යුතු අතර එම අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2024.02.22** දින හෝ එදිනට පෙර "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බී දොරටුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**03.** අයදුම්පත්‍රය :- ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතයට ගනිමින් පිළියෙල කරගත් අයදුම්පත්‍රය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය.

**04.** විභාග ගාස්තු :- පළමුවරට මෙම විභාගයට පෙනී සිටීමට කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන් පසු වාරවලදී නිලධාරියෙකු විසින් සම්පූර්ණ විභාගය සඳහා පෙනී සිටින්නේ නම් රු. 300/- ක විභාග ගාස්තු වශයෙන් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරණ ආදායම් ශීර්ෂයට බැර වන පරිදි වයඹ පළාත තුල පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ව.ප.ස.මු.- 02 ආකෘතියෙන් ලබාගත් රිසිට්පත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**05.** අනන්‍යතාව :- විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කවරක් වුවද පිළිගත හැකිය.

- **I.** පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
- **II.** වලංගු විදේශ ගමන් බලපත්‍රය ( පාස්පෝට් බලපත්‍රය )

III. වලංගු රියදුරු බලපත්‍රය

06. විභාග ප්‍රවේශපත්‍ර :- විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති ලිපිනයට විභාග ප්‍රවේශපත්‍රය යොමු කරනු ලැබේ. එලෙස විභාග ප්‍රවේශපත්‍රය නොලැබුණ අයදුම්කරුවන් වෙතොත් විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයෙන් විමසිය යුතුය.

07. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර යොමු කළ වහාම ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) පළකරන අතර, ඒ බව අදාළ දෙපාර්තමේන්තු වෙත ද ලිඛිතව දැනුම් දෙනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාළ අයදුම්කරුවන්ට ඒ පිළිබඳව දැනුවත් කළ යුතුය.

08. විභාගය සඳහා ප්‍රවේශපත්‍ර ලැබූ, පළමු වතාවට විභාගයට පෙනී සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය අතර ගමන් ගාස්තු නොගෙවිය යුතුය.

09. අපේක්ෂකයින් අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.

10.විභාගය පිළිබඳ විස්තර :-

මෙම පරීක්ෂණය පහත සඳහන් විෂය සම්බන්ධයෙන් සැකසෙන ලිඛිත ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

| අනු අංක | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් අවම ලකුණු |
|---|---|---|---|---|
| 1 | සිද්ධි අධ්‍යයනය | පැය 03 යි | 100 | 40% |

11. විභාගය සඳහා වන විෂය නිර්දේශ :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. සිද්ධි අධ්‍යයනය | ක්ෂේත්‍රයට අදාළව නිර්මාණය කරනු ලබන ගැටළු සහගත සිද්ධීන් එකක් හෝ වැඩි ගණනක් ආශ්‍රයෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරනු ලැබේ. එමගින් අපේක්ෂකයින්ගේ තර්ක ශක්තිය, නිර්මාණශීලීත්වය ,ගැටළු විශ්ලේශනය යනාදිය හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව සහ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම පිළිබඳව ඔවුන් තුළ පවත්නා අවබෝධය පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. |

**12.** මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කරනු ඇත.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

ඊ.එම්.පී.ඒකනායක,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

ආදර්ශ අයදුම්පත්‍රය

<u>**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024**</u>

**01.1.1** මුලකුරු සමඟ නම (සිංහලෙන්) :-
........................................................................................ මයා/මිය/මෙනවිය

**1.2** මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :- ..........................................................................

**1.3** මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :- ..........................................................
.................................................................................................................................

**1.4** විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail) :- .......................................................................
.........................................................................................................................

**1.5** ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**1.6** උපන් දිනය :-අවුරුද්ද | | | | | මාසය | | | දිනය | | |

**02.** සේවා ස්ථානය හා ලිපිනය :-

**2.1** කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම :- ...............................................
.................................................................................................................................

**2.2** රාජකාරි ලිපිනය :- .......................................................................................
..........................................................................................................................

**2.3** දුරකතන අංකය :- රාජකාරී : ..................................................
පෞද්ගලික : ..................................................

**03.** දැනට දරණ තනතුර :-

**3.1** තනතුර : ...............................................................................................

**3.2** ශ්‍රේණිය : ...............................................................................................

**3.3** ඉහත ශ්‍රේණියට පත්වූ දිනය :.................................................................

**04.** ඔබ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය :- | |

(සිංහල - S , දෙමළ - T , ඉංග්‍රීසි - E )

(අදාල අක්ෂරය කොටුව තුල ලියන්න)

**05.** ඔබ විභාගයට ඉල්ලුම් කරන විෂයයන් :-

**I.** ................................................................................

**06.** ඔබ මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද ? ..........................................

**6.1** එසේ නොවන්නේ නම් විභාග ගාස්තු ගෙවා ලබාගත් (අලවා ඇති) කුවිතාන්සියේ,

කුවිතාන්සි අංකය :- .......................................... මුදල :- ..................................

දිනය :- .......................................................

නිකුත් කල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ............................................................

| කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

**07.** අයදුම්කරුගේ සහතිකය :-

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත 4 ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති රීති පිළිපැදීමටද එකඟ වන අතර මා වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු/ නිලධාරිනියක බවද සහතික කරමි.

.........................................................

අයදුම්කරුගේ අත්සන

දිනය:- ....................................

**08.** දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-

I. ඉහත විස්තර සඳහන් ....................................................................... නැමැති මෙම නිලධාරියා/ නිලධාරිනිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු /නිලධාරිනියක බවද,

II. ඔහු/ඇය සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි .............. ශ්‍රේණියේ නිලධාරියෙකු බවද, මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇති බවද,

III. මෙම විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවට බවද/ පළමු වතාවට නොවන බවද, නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඇති/ නැති බවද,

IV. අයදුම්කර ඇති භාෂා මාධ්‍යයෙන් පෙනී සිටීමට හිමිකම ඇති බවද,

V. ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවද,

සහතික කරමි.

(අදාල නොවන වචන කපා හරින්න)

...............................................

ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

පදවි නාමය :............................................................

ලිපිනය :...........................................................

දිනය :............................................................